**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව**
**අධ්‍යාපන අමාත්‍යාංශය**
**<u>ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් තනතුරුවලට පත් කිරීම - 2021</u>**

**පහත තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ඇති නිලධාරීන්ගෙන් දීප ව්‍යාප්තව අයදුම්පත් කැඳවනු ලැබේ.**

| තනතුර | පුරප්පාඩු ගණන |
|---|---|
| අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ | 03 |
| අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ | 02 |
| ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් | 02 |
| **මුළු පුරප්පාඩු ගණන** | **07** |

## 1. සුදුසුකම්

I. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරියෙකු වීම
II. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 1/2020 අනුව කිසිදු විනය දඬුවමකට යටත් නොවූ සහ වසර 5ක කාලය තුළ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
III. සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම.

## 2. අයදුම්පත් යොමු කළ යුතු ආකාරය

I. මේ සමඟ දක්වා ඇති ආකෘතිය ආදර්ශ ආකෘතියට අනුකූලව A4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙළ කරන ලද අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර, **2021.04.09** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **"සහකාර ලේකම්, අධ්‍යාපන සේවා ආයතන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍රය බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු සඳහා ඉල්ලුම් කිරීම" යනුවෙන් සඳහන් කොට තිබිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

II. ඔබගේ මෑතකදී ලබා ගන්නා ලද අඟල් 2x2$^1/_2$ වර්ණ ඡායාරූපයක් අයදුම්පතේ දකුණු පස ඉහළ කෙළවරෙහි අලවා එවිය යුතු වේ.

III. ලියාපදිංචි තැපෑලට යොමු කිරීමට ප්‍රථම සම්පූර්ණ කරන ලද ඔබගේ අයදුම්පතේ ස්කෑන් පිටපතක් (Scan Copy) පහත ආකාරයට විද්‍යුත් තැපෑලෙන් ද යොමු කළයුතු වේ.

E-mail = **eseas.moe@gmail.com**
Subject = Calling application for the post of Director of Education
(NAME & ID No)

## 3. ක්‍රමවේදය

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යපටිපාටික රීති අනුව, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් කරනු ලබන නිර්දේශ මත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් පත් කරනු ලැබේ.

4. අදාළ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය බත්තරමුල්ල, ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශයේ දී පැවැත්වේ. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ. මෙම තනතුරු වලට පත්කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

5. සිංහල,දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ නියමය පරිදි,

මහාචාර්ය කේ. කපිල සී.කේ. පෙරේරා
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය
2021.04.22